"පී.බී.ගේ පණ්ඩිතකමට ආසියානු සංවර්ධන බැංකුව ණය නොදෙයි" යනුවෙන් වන සිරස්තලයක් සමගින් පුවත් වාර්තාවක් රාවය පුවත්පතේ (12/06) දැක්වී තිබිණි. කෙසේ නමුත් මෙම පුවත් වාර්තාවේ අන්තර්ගතයේ සඳහන් වන්නේ, මහජන උපයෝගිතා කොමිසම අහෝසි කළහොත් ආසියානු සංවර්ධන බැංකුවෙන් මෙරටට ලබාදෙන ණය ආධාර නොලැබීමේ දැඩි අවදානමක් පවතින බව ආසියානු සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර ආරංචි මාර්ග වලින් රාවයට දැනගන්නට ලැබුණු බවයි.

කරුණු මෙසේ වන විට, ඉහත සිරස්තලය ඔස්සේ ආසියානු සංවර්ධන බැංකුව ණය ලබාදීම නොකරන බව ගම්‍ය නොවන්නේද? කෙසේ නමුත්, සැබෑ ප්‍රවෘත්තිය වන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ණය ආධාර මෙරටට ලබා නොදීමේ "දැඩි අවදානමක්" පැවතීම නොවන්නේද? ඒ අනුව බලන කල, මෙම සිරස්තලය පාඨකයාව නොමඟ යවන සුළු නොවන්නේද? උක්ත සිරස්තලය ප්‍රශ්නාර්ථයක් සමගින් හෝ ඉදිරිපත් වූයේ නම් මෙම ගැටළුව මතු නොවන්නේ නොවේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaNews #Ravaya**